“ඔබලා මා සොයනවා ඇත; ඔබලාගේ මුලු සිතින්
මා සොයනා කළ, මා ඔබලාට සම්භවෙනවා ඇත”

# දෙවියන් අඳුනාගන්නෙ කෙසේද

# දෙවියන් අඳුනාගන්නේ කෙසේද

ආබ්‍රහම් යටහත්කමින් හා කීකරුකමින් "දෙවියන්වහන්සේගේ මිතුරෙකු" වූ ලෙසම, ඔබටද, දෙවියන්වහන්සේ අඳුනාගෙන, එතුමාගේ කරුණාව සාමය හා ආසිරි අත්දැකීමට පුළුවන. ජීවිතයේ උදර අත්දැකීම නම්, විශ්වාසය තුල සැබෑ ලෙස යටහත්ව එතුමා අඳුනාගැනීමය. මුළු සිතින් එතුමාව සොයන්නන්ට, දෙවියන්වහන්සේගේ එළිදරව්වීම කොපමණ චමත්කාරද !

ඔබගේම පුද්ගලික මාවත්වලින් ඔබ හැරී දෙවියන්වහන්සේට **සැබෑ ලෙස යටත් වූ විට,** එතුමාගේ ආත්මය ඔබ තුල ජීවත් වෙයි. ඔබ එතුමාගේ පොරොන්දු **විශ්වාසකර,** කීකරුව එතුමාව අනුගමනය කරනා කළ එතුමාගේ ආදරයෙන් ඔබව වෙන් කිරීමට කිසිවකුට නුපුළුවන. ඔබගේ දෙවියන් එතුමා වෙයි. බෙහෙවින් අගනා කළ එතුමාගේ උරුමය ඔබ වෙයි. මිළ කළ නොහැකි ගණනකට ඔබව ගත් බවද, **දැනුත් සදාකාලයටත්** ඔබ හා සමග සහභාගිකම් පැවැත්වීමට එතුමා සතුටු බවද, ඔබටම අනාවරණය වෙයි.

මෙම පිටුවල ඇති දේව වචනයෙන් උපුටාගත් කොටස් ඔබ ඉගෙනගන්නා කළ එහි තේරුම ඔබට වටහා දෙන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. දේව අනුග්‍රහය ලත් භක්තිවන්තයෝ මෙම වචන ලිව්හ. මේවා විනාශ කිරීමට සාතන් කොපමණ තැත් කළත්, ඉතා මවිත ලෙස පරම්පරාවෙන් පරම්පරාවට දෙවියන්වහන්සේම ඒ සියල්ල සුරක්ෂිතව තැබූහ.

# එකම සැබෑ දෙවි කෙනෙක් පමණක් සිටිති 

**ද්විතීය 6:4 ආ, 5**

අපේ දෙවි වූ ස්වාමින් එකම ස්වාමින්වහන්සේය. ඔබේ දෙවි වූ ස්වාමින්වහන්සේට ඔබේ මුළු සිතෙන්ද, ඔබේ මුළු ආත්මයෙන්ද, ඔබේ මුළු ශක්තියෙන්ද, ප්‍රේම කරන්න.

**යෙසායා 45:18**

මක්නිසාද ස්වර්ගයන් මැවූ, පොලොව මවා සාද එය පිහිට වූ, එය හිස්කමට නොමවා, වාසය පිණිස එය සෑදූ දෙවියන්වහන්සේ වන ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක: මම ස්වාමින්වහන්සේය, වෙන කෙනෙක් නැත.

**යෙසායා 42:8**

මම ස්වාමීන්වහන්සේය ; එය මාගේ නාමය වෙයි. මාගේ ගෞරවය අන් කෙනෙකුටවත් මාගේ ප්‍රසංසාව රූපවලටවත් නොදෙමි.

**යෙසායා 43:10, 11**

මම ඒ තැනැන්වහන්සේ බව ඔබලා දැන මා විශ්වාසකර තේරුම් ගන්නා පිණිස ඔබලා මාගේ සාක්ෂිකාරයෝ යයි ...... ස්වාමින් වහන්සේ කියනසේක. මට පළමු වෙන් කිසි දෙවිකෙනෙකු සාදනු ලැබුවේ නැත. මට පසුව සිටින්නේත් නැත. මම, මමම ස්වාමින්වහන්සේය, මා හැර වෙන ගැලවුම්කරුවෙක් නැත.

**යෙසායා 45:22**

පොළොවේ සීමාවල සිටින සියල් ලෙනි, මා වෙත හැරී ගැළවෙන්න. මක්නිසාද, මම දෙවියන්වහන්සේය. වෙන කෙනෙකු නැත.

# 2 දෙවියන්වහන්සේ දයාවන්තය, කරුණාවන්තය

## ගීතාවලිය 103:8, 11

ස්වාමීන්වහන්සේ අනුකම්පාවෙන් හා දයාවෙන් පිරී සිටිති. කෝපවීමට පමාය, බෙහෙවින් කරුණාවන්තය. මක්නිසාද පොළොවට උඩින් අහස උස්ව තිබෙනා සේ එතුමා කෙරෙහි බිය ඇති අයට එතුමාගේ කරුණාව මහත්ය.

## ගීතාවලිය 103:17 අ, 18 ආ

නමුත් ස්වාමින්වහන්සේගේ කරුණාව තමන්ට බිය ඇති අය කෙරෙහි සදහෙන් සදහටද.......... එතුමාගේ පනත් ඉෂ්ට කිරීම පිණිස ඒවා සිහි කරන්නන්ටද වෙයි.

## මීකා 7:18

අපරාධය කමා කරන.........ඔබවහන්සේට සමාන දෙවිකෙනෙකු කවුද ? ......... එතුමා කරුණාවට ප්‍රිය කරන නිසා.........

## විලාප ගී 3:22

අප විනාශ නොවුයේ ස්වාමින් වහන්සේගේ කරුණාව නිසාත්, එතුමාගේ අනුකම්පාව නොනවතින නිසාත්ය.

## විලාප ගී 3:32

එතුමා ශෝකය පමුණුවන නමුත් සිය බහුල කරුණාව ලෙස අනුකම්පා කරති.

## 1 ලේකම් 16:34

ස්වාමින්වහන්සේට ස්තුති කරන්න. මක්නිසාද යත් එතුමා යහපත්ය. එතුමාගේ කරුණාව සදකල් පවතින්නේය.

# දෙවියන්වහන්සේ ඔබට ආදරෙයි 

### යෙරෙමියා 31: 3

ස්වාමින්වහන්සේ පුරාණයේ දී මට ප්‍රකාශ වී : එසේය, සදකාල ප්‍රේමය-කින් ඔබට ප්‍රේම කෙළෙමි. එබැවින් දයාවෙන් ඔබව ඇදගනිමියි කීසේක.

### යෙරෙමියා 29:11

මා විසින් ඔබලා ගැන කරන යෝජනා මමම දනිමි. බලා-පොරොත්තු වන අවසානයක් දීමට, ඒවා විපත්තියේ ඒවා නොව, සාමයේ යෝජනාය.

### මලාකි 1:2 අ

මම ඔබලාට ප්‍රේම කෙළෙමියි ස්වාමින්වහන්සේ කියනසේක.

### යෙසායා 38:17

බලව , මට තද ශෝකය පැමුණුනේ මාගේ සාමය පිණිසය. නුමුත් ඔබ මාගේ ආත්මයට ඇති ප්‍රේමය නිසා විනාශය නැමති වලෙන් එය මුදු ගත්සේක ; එසේය, ඔබ මාගේ පාප සියල්ල ඔබ පිටුපසට දැමූහ.

### 1 යොහන් 4:16අ, 19

දෙවියන්වහන්සේගේ අපට ඇති ප්‍රේමය, අපි දැන විශ්වාසකර සිටිමුව. අප ප්‍රේම කරන්නේ එතුමා පළමුව අපට ප්‍රේම කළ නිසාය.

### ශෙපනියා 3:17

ඔබ අතර සිටින ස්වාමිවූ දෙවියන් වහන්සේ බලවත්ය. එතුමා ගළවන සේක; ඔබ කෙරෙහි එතුමා සන්තෝෂ යෙන් ප්‍රීතිවී සිය ප්‍රේමයෙහි නිශ්වලව සිටිනසේක. ප්‍රීති ගෝෂාවෙන් ඔබ කෙරෙහි ප්‍රීතිවනසේක.

# 4 දෙවියන්වහන්සේ අඳුනාගැනීම ජීවිතයේ උසස්ම දෙය වෙයි

**දනියෙල් 11 : 32 ආ**

නුමුත් සිය දෙවියන්වහන්සේව හඳුනන ජනයා බලවත්ව සමර්ථකම් කරති.

**යෙරෙමියා 9 : 24**

නුමුත් පාරට්ටුකරගන්නා පොලො-වෙහි කරුණාවත්, විනිශ්චයත්, ධර්මිෂ්ඨකමත් පවත්වන ස්වාමින්-වහන්සේ මම බව තේරුම් ගෙන, මා හඳුනාගැනීම නිසා පාරට්ටුකර ගනීවා. මක්නිසාද, මා ප්‍රිය වෙන්නේ එම දෙයටයි ස්වාමින්වහන්සේ කියනසේක.

**ව්‍යවස්ථාවිවරණය 30 : 19, 20**

මා විසින් ජීවනය හා මරණයද, ආසිරි හා සාපද, ඔබලා ඉදිරියේ තබා ඇත...... එබැවින් ......ජීවත් වන පිණිස ජීවනය තෝරාගෙන ...... ඔබේ දෙවි වූ ස්වාමින්වහන්සේට ප්‍රේමකර, එතුමාගේ හඬට කීකරුව එතුමාට ඇලුම්ව සිටින්න. මක්නිසාද එතුමා ඔබ ජීවනයයි.

**හොෂෙයා 6 : 6**

මම පූජාවට නොව, කරුණාවටත්, දවන පූජාවලට වඩා දෙවියන් වහන්සේව අඳුනාගැනීමටත් කැමැත්තෙමි.

**ගීතාවලිය 42 : 1**

දෙවියන්වහන්ස, මුවා දිය දෙළට ආසා වෙන්නාක් සේ මාගේ ආත්මය ඔබ කෙරෙහි ඉතා ආසා ඇත්තේය.

# දෙවියන්වහන්සේගෙන් නිදහස්ව ජීවත්වීම භයානකය 5

### 2 ලේකම් 15 : 2ආ

ඔබලා ස්වාමින්වහන්සේ සමග සිටින තුරු එතුමා ඔබලා සමග සිටින සේක. ඔබලා එතුමා සොයන්නේ නම් එතුමා ඔබලාට සම්බවෙනවා ඇත. ඔබලා එතුමාව අත්හරී නම්, එතුමාද ඔබලාව අත්හරිනවා ඇත.

### යෙරෙමියා 17 : 9

සියල්ලට වඩා සිත රැවටිලිකාරව ඇත. එය දුෂ්ඨව තිබෙ. එය දැනගැනීමට හැකි කාහට ද?

### හිතෝපදේශ 16 : 25

මිනිසාට හරියයි පෙනෙන මගක් ඇත. නුමුත් එහි කෙළවර මරණයේ මග වෙයි.

### 2 පේතෘස් 2 : 4, 9, 10

මක්නිසාද දේව දූතයන් පව් කළ විට, දෙවියන්වහන්සේ ඔවුන්ට දඩුවම් නොකර නැර විනිශ්චය පිණිස වෙන්කර තැබීමට නිරයෙහි හෙළා අන්ධකාරයේ ගුහාවලට භාර දුන් සේක. භක්තිවන්තයන් පරීක්ෂාවෙන් ගළවන්ටත්, අධර්මිෂ්ඨයන්..... දඩුවම් පිණිස විනිශ්චය දක්වා තබන්නටත් ස්වාමින්වහන්සේ දන්නාසේක.

### යොහන් 15 : 6

යමෙක් මා තුළ නොපවතී නම්, ඔහු අත්තක් මෙන් පිටත දමනු ලැබ වියළී යයි. ඒවා එකතුකර ගින්නට දමනු ලැබෙ. ඒවා පිළිස්සී යන්නේය.

# දෙවියන්වහන්සේ අඳුනාගැනීමට අප එතුමා සෙවිය යුතුය

## යෙරෙමියා 29 : 13

ඔබලා මා සොයනවා ඇත. ඔබලාගේ මුළු සිතින්ම මා සොයනා කළ, මා ඔබලාට සම්බවෙනවා ඇත.

## හිතෝපදේශ 2 : 4අ, 5

ඔබ රන් රිදී මෙන් සොයා නිධාන මෙන්......විභාග කරයි නම් ...... ඔබ...... දෙවියන්වහන්සේ අඳුනා ගැනීමටද පැමිණෙන්නේය.

## මතෙව් 7 : 7

ඉල්ලන්න, එවිට ඔබලාට දෙනු ලැබේ; සොයන්න, එවිට ඔබලාට සම්භවේ; තට්ටුකරන්න, එවිට ඔබලාට දෙර හරිනු ලැබේ.

## හිතෝපදේශ 8 : 17

මට ප්‍රේම කරන්නන්ට මම ප්‍රේම කරමි. මාව පළමුව සොයන්නන්ට මා සම්භවේ.

## විලාප ගී 3 : 25

ස්වාමින්වහන්සේ ගැන බලා සිටින්නන්ටත් එතුමා සොයන ආත්මයටත් එතුමා යහපත්ය.

## ක්‍රියා 17 : 26, 27

සියලු මිනිස් ජාතීන් එක් ලෙයකින් ...මැවූසේක. මෙසේ කළේ අතගායමින්වත් යම් අන්දමකින් දෙවියන්වහන්සේව සම්භවන පිණිසය, එහෙත් අප එකිනෙකාට එතුමා නුදුරුව සිටිනසේක.

# අප එතුමා වෙත ඒම දෙවියන්වහන්සේගේ කැමැත්තය 

### 2 ලේකම් 30 : 9

මක්නිසාද ඔබලාගේ දෙවි වූ ස්වාමින්වහන්සේ දයාවද අනුකම්පාවද ඇති කෙනෙකි. ඔබලා එතුමා වෙත හැරී ආ කළ එතුමා ස්වකීය මුහුණ ඔබලා කෙරෙන් හරවා නොගන්නාසේක.

### ගීතාවලිය 86 : 5

මක්නිසාද ස්වාමිනි ඔබ යහපත්ය. කමාවෙන්ට සූදනම්ය. ඔබට යාඥා කරන සියල්ලන්ට, ඔබ බොහෝ කරුණාවන්තය.

### යාකොබ් 4 : 8අ

දෙවියන්වහන්සේට ළං වෙන්න, එවිට එතුමා ඔබට ළං වනසේක.

### ගීතාවලිය 145 : 18

ස්වාමින්වහන්සේ තමන්ට යාඥා කරන සියල්ලන්ට, එනම්, සැබවින්ම එතුමාට යාඥා කරන සියල්ලන්ට ළංව සිටිනසේක.

### මතෙව් 11 : 18, 29

වෙහෙසෙන, බර උසුලන සියල්ලෙනි, එන්න මා වෙත, මම ඔබලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින් මාගේ වියගහ ඔබලා පිට ගෙන, මාගෙන් ඉගෙනගන්න. එවිට ඔබලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය.

### යොහන් 6 : 37ආ

මා වෙත එන තැනැත්තාව, මා විසින් කිසිසේත් අහක නොදමමි.

# දෙවියන්වහන්සේ ශුද්ධය

## නික්මයාම 15 : 11අ

ශුද්ධකමින් මහිමවත් වූ ...ස්වාමින් වහන්ස ...... ඔබට සමාන කවුද ?

## 1 සාමුවෙල් 2 : 2අ

ස්වාමින්වහන්සේ මෙන් ශුද්ධ වූ කෙනෙක් නැත; මක්නිසාද ඔබ ඇර වෙන දෙවි කෙනෙකු නැත.

## යෝබ 24 : 10ආ

දෙවියන්වහන්සේගෙන් දුෂ්ටකම් කිරීමද, සර්වපරාක්‍රමයාණන්ගෙන් අයුතුකම් කිරීමද දුරුව ඇත.

## යෙසායා 6 : 3ආ

සේනාවල ස්වාමින්වහන්සේ ශුද්ධය, ශුද්ධය, ශුද්ධය. මුළු මිහිතලය එතුමාගේ තේජසින් පිරී ඇත.

## යෙසායා 7 : 15

මක්නිසාද, උසස් වූ, උත්කෘෂ්ට වූ, සදාකාලයේ වසන්නා වූ, ශුද්ධ යන නාමය ඇති තැනැන්වහන්සේ මෙසේ කියනසේක : මම උසස් වූ, ශුද්ධ වූ ස්ථානයෙහි... වාසය කරමි.

## ගීතාවලිය 145 : 17

ස්වාමීන්වහන්සේ සිය මාර්ගවල දී ධර්මිෂ්ඨය සිය සියලු ක්‍රියාවලින් දයාවන්තය.

## එළිදරව් 15 : 4අ

ස්වාමිනි ඔබගේ නාමයට බය නොවන්නේත්, ගෞරවය නොකරන්නේත් කවුද ? මක්නිසාද ඔබ පමණක් ශුද්ධය.

# දෙවියන්වහන්සේගේ සෙනඟ ශුද්ධව ජීවත් විය යුතුය 9

**යාකොබ් 2 : 19, 20; 1 : 22**

ඇත්තේ එකම දෙවි කෙනෙකු බව ඔබ විශ්වාස කරන්නෙහිය; එසේ කිරීම යහපත්ය. යක්ෂයෝත් විශ්වාසකර වෙව්ලති. නුමුත් හිස් වූ මනුෂ්‍යය, ක්‍රියා නැති ඇදහිල්ල නිෂ්ඵල බව දැනගැනීමට ඔබ කැමතිද? නුමුත් ඔබලාවම රවටාගනිමින් වචනය අසන්නෝ පමණක් නොවී, එය පිළිපදින්නෝද වෙන්න.

**1 යොහන් 2 : 4 ; 3:10**

එතුමා අඳුනමියි කියා එතුමාගේ පනත් නොපවත්වන්නා බොරුකාරයෙකි. සැබෑව ඔහු තුළ නැත. මෙයින් දෙවියන්වහන්සේගේ දරුවෝද, යක්ෂයාගේ දරුවෝද ප්‍රකාශව සිටිති. ධර්මිෂ්ඨකම් නොකරන කවරෙක් හෝ තම සහෝදරයාට ප්‍රේම නොකරන්නෙක් හෝ දෙවියන්වහන්සේගෙන් නොවේ.

**හිතෝපදේශ 15 : 9**

දුෂ්ඨයාගේ මාර්ගය **ස්වාමින්** වහන්සේට පිළිකුළකි. එහෙත් ධර්මිෂ්ඨකම අනුව යන්නාට එතුමා ප්‍රේම කරති.

**හෙබ්‍රෙව් 12 : 14**

සියල්ලන් හා සමාදනව සිටින්න. ශුද්ධකම නොමැතිව කිසිවෙක් ස්වාමින්වහන්සේව නොදක්නා බැවින්, එය අනුව යන්න.

# දෙවියන්වහන්සේ අණකරන දෙය

### මීකා 61 : 8 ආ

ධර්මිෂ්ඨකම් කිරීමත්, කරුණාවට ප්‍රේම වීමත්, ඔබේ දෙවියන්වහන්සේ වෙත යටහත්ව හැසිරීමත් මිස, ස්වාමින්වහන්සේ ඔබෙන් වෙන කුමක් ඉල්ලත්ද ?

### ලෙවී 19 : 2 ආ

ඔබලා ශුද්ධව සිටිය යුතුය. මක්නිසාද, ඔබලාගේ දෙවි වූ ස්වාමින්වහන්සේ වන මම ශුද්ධය.

### ලූක් 10 : 27 ආ

ඔබේ මුළු හෘදයෙන්ද, ඔබේ මුළු ආත්මයෙන්ද. ඔබේ මුළු ශක්තියෙන්ද, ඔබේ මුළු බුද්ධියෙන්ද, ඔබ දෙවි වූ ස්වාමින්වහන්සේට ප්‍රේම කළ යුතුය. තම අසල්වැසියාටද තමාටම මෙන් ප්‍රේම කළ යුතුයි.

### මාර්ක් 10 : 19

මිනී නොමරන්න, කාමමිථ්‍යාචාරය නොකරන්න, සොරකම් නොකරන්න, බොරු සාක්ෂි නොදෙන්න, වංචා නොකරන්න, ඔබගේ පියාටත් මවටත් ගෞරවය කරන්න, යන මෙම ආඥා ඔබ දන්නේය.

### යෝෂුවා 1 : 8

මෙම ව්‍යවස්ථා පොත ඔබේ මුඛයෙන් පහනොවේවා. එහි ලියා ඇති සියල්ල කිරීම පිණිස දිවා රාත්‍රී ඒ ගැන මෙනෙහි කරන්න. එවිට ඔබ මාර්ගය සඵල වී ඔබට යහපතම සිදුවෙයි.

### මාර්ක් 11 : 22 ආ

දෙවියන්වහන්සේ තුළ ඇදහිල්ලෙන් සිටින්න.

## හිතෝපදේශ 6:16–19

**ස්වාමීන්වහන්සේ** ද්වේශ කරන කාරණා හයක් ඇත; එසේය, එතුමාට පිළිකුල් වූ කාරණා සතක් තිබේ: උඩඟු නෙත්, බොරුකාර දිව, නිදෙස් ලේ වගුරුවන අත්, දුශ්ට උපා යොදන සිත, නපුරට දිවීමට ඉක්මන් පාද, මුසාවන් කියන බොරු සාක්ෂිකරු සහ සහෝදරයන් අතර භේද පතුරවන්නාය.

මක්නිසාද, **ස්වාමීන්වහන්සේ** වන මම, යුක්තියට ප්‍රියව, කොල්ලකෑමට ද්වේශ කරමි. —**යෙසායා 61:8අ**

## එළිදරව් 21:8

නුමුත් බිය ඇත්තන්ටත් අවිශ්වාස කරන්නන්ටත්, පිළිකුල්ව සිටින්නන්ටත්, මිනීමරන්නන්ටත්, වෛශ්‍යකම් කරන්නන්ටත්, මායාකාරයන්ටත්, රූප වඳින්නන්ටත්, සියලු බොරුකාරයින්ටත්, ගින්නෙන් හා ගෙන්දගමින් දැවෙන විලෙහි සිය කොටස වෙයි. එය දෙවන මරණයයි.

## මලාකි 2:15 ආ, 16අ

එබැවින් ඔබලාගේ ආත්මය ගැන ප්‍රවේසම් වෙන්න. කිසිවෙක්, සිය යොවුන් වියේ බිරිඳට විරුද්ධව ද්‍රෝහිව ක්‍රියා නොකරත්වා. මක්නිසාද (බිරිඳ) අත්හැර දැමීමට මම ද්වේශ කරමියි.....**ස්වාමීන්වහන්සේ කීසේක.**

ඔබලාගේ සිතින් එකිනෙකාට විරුද්ධව නපුරු යෝජනා නොකරන්න; බොරු දිවිරීමට ප්‍රිය නොවන්න. මක්නිසාද, මේ සියල්ලටම මම ද්වේශ කරමියි ස්වාමීන්වහන්සේ කීසේක. —**සෙකරියා 8:17**

# දෙවියන්වහන්සේගේ නියමයන්ගෙන් මිනිසා පසුබටව සිටියි

**යොහන් 5:42**

නුමුත්, මම ඔබලා අඳුනමි. දේව ප්‍රේමය ඔබලා තුල නැති බව දනිමි.

මක්නිසාද, යමෙක් සියලු පනත් රැක, එක් අණක් කඩ කළේ නම්, ඔහු සියල්ල ගැන වරදකරුවෙක් වන්නේය. —යාකොබ් 2:10

**යාකොබ් 4:17**

එබැවින්, යමෙක් යහපත කිරීම දන, එය නොකරයි නම්, ඔහුට එය පාපය වෙයි.

**රෝම 3:10**

මෙසේ ලියා තිබේ: ධර්මිෂ්ඨ කෙනෙක් නැත. එසේය, එක්කෙනෙකුවත් නැත.

**රෝම 3:23**

සියල්ලෝම පව්කර දේව මහිමයෙන් හීනවී සිටිති.

**යෙසායා 53:6අ**

අපි සියල්ලෝම බැටළුවන් මෙන් මුළා වී එකිනෙකා සිය මාර්ගවලට හැරී ගියෙමුව.

**1 යොහන් 3:10 ආ**

ධර්මිෂ්ඨකම් නොකරන්නෙක්වත් සිය සහෝදරයාට ප්‍රේම නොකරන්නෙක්වත් දෙවියන්වහන්සේගෙන් නොව.

**1 සාමුවෙල් 6:20ආ**

ස්වාමින්වහන්සේ, එනම්, මෙම ශුද්ධ දෙවියන්වහන්සේ ඉදිරියේ සිටීමට පුළුවන් කාටද?

# අප පුද්ගලික ක්‍රියාවලින් දෙවියන්වහන්සේ සතුටු කිරීමට නුපුළුවන 

**රෝම 10:2, 3**

මක්නිසාද, දෙවියන්වහන්සේ උදෙසා ජ්වලිතිකමක් ඔවුන්ට ඇති බවට ඔවුන් ගැන මම සාක්ෂි දෙමි. නමුත් එය දැනගැන්ම ඇතිව නොවේ. මක්නිසාද, ඔවුන් දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම නොදැන, සිය ධර්මිෂ්ඨකම ස්ථිර කිරීමට සොයමින්, දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකමට යටත් නුණෝය.

**එසකියෙල් 33:13**

ඔබ සැබවින්ම ජීවත් වන්නේයයි, මම ධර්මිෂ්ඨයාට කී විට, ඔහු සිය ධර්මිෂ්ඨකම කෙරෙහි විශ්වාසකරමින් අයුතුකම් කළ විට, ඔහුගේ සියලුම ධර්මිෂ්ඨකම් සිහිකරනු නොලැබේ. ඔහු කළ සිය අයුතුකම නිසා, ඔහු නසිනවා ඇත.

**රෝම 8:8**

මෙසේ මාංසයේ සිටිනා අයට දෙවියන්වහන්සේව සතුටු කිරීමට නුපුළුවන.

**රෝම 3:20අ**

කුමක් හෙයින්ද, ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් කිසිම මිනිසෙක් දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨ කරනු නොලබන්නේය.

**2 කොරින්ති 3:5**

එහෙත් අපෙන්ම වූ සේ, අප තුළින්ම යමක් යෝජනා කිරීමට අපගේ සමර්ථකමක් නැත. අපගේ සමර්ථකම දෙවියන්වහන්සේගෙන්ය.

# පාපය අපව දෙවිතුමගෙන් වෙන්කරයි

**රෝම 5:12**

එහෙයින් එක් මිනිසෙකු නිසා පාපයද, පාපය නිසා මරණයද, ලෝවට ඇතුලු වූ සේ, සියලු මිනිසුන් පව් කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමිණුනේය.

**යාකොබ් 1:15**

එකල තෘෂ්ණාව පිළිසිඳගත් කළ පාපය ප්‍රසූත කරයි; පාපයද සම්පූර්ණ වූ කළ මරණය උපදවයි.

**එසකියෙල් 18:20අ**

පව් කරන ආත්මය නසින්නේය.

**යෙසායා 59:2**

නමුත් ඔබලාගේ අපරාධ, ඔබලා හා ඔබලාගේ දෙවියන්වහන්සේ අතර වෙන්වීමක් කළේය. උන්වහන්සේ නොඅසන පිණිස ඔබලාගේ පාප උන්වහන්සේගේ මුහුන ඔබලාගෙන් සැඟෙව්වේය.

**2 ලේකම් 24:20අ**

දෙවියන්වහන්සේ මෙසේ කියති; ඔබලා සඵල නොවන පිණිස, ඔබලා ස්වාමින්වහන්සේගේ පනත් කඩකරන්නේ මන්ද ? ඔබලා ස්වාමින් වහන්සේ අත්හැරිය නිසා, උන්වහන්සේද ඔබලාව අත්හරිනසේක.

**1 සාමුවෙල් 15:23අ**

මක්නිසාද, කැරළිකාරකම ජේන කීමේ පාපයටත්, මුරණ්ඩුකම දේවතා හා රූප ඇදහිමටත් සමානය. ඔබ ස්වාමින්වහන්සේගේ වචනය පහ කළ නිසා, උන්වහන්සේද ඔබව......පහ කළසේක.

### ගීතාවලිය 7:11

දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨයාව විනිශ්චය කරති: දෙවියන්වහන්සේගේ උදහස සැමදින නපුරා කෙරෙහි ඇත.

### නාහුම් 1:3

ස්වාමින්වහන්සේ ඉවසීමෙන්ද, බලයෙන්ද මහත්ව සිටිති; නපුරාව කිසිසේත් නිදහස් නොකරති.

### රෝම 1:18

මක්නිසාද, සත්‍යය අධර්මිෂ්ඨකමින් වළක්වන, සියලු මිනිස් අභක්තිකමටද, අධර්මිෂ්ඨකමටද විරුද්ධව දෙවිතුමගේ උදහස ස්වර්ගයෙන් එළිදරව් වී තිබේ.

### රෝම 1:29–32

ඔවුහු සියලු අධර්මිෂ්ඨකමින්ද, කාමමිථ්‍යාවෙන්ද, දුෂ්ඨකමින්ද, ලෝබකමින්ද, නපුරුකමින්ද, ඊර්ෂ්‍යාවෙන්ද, මිනීමැරීමෙන්ද, දබරයෙන්ද, වංචාවෙන්ද, ක්‍රෝධයෙන්ද, පිරී සිටියහ. තවද කනට කොඳුරන්නන්, කේළම් කියන්නන්, දෙවියන්වහන්සේට පිළිකුල්ව සිටින්නන්, නින්දකරන්නන් උඩඟුවූවන්, පාරට්ටුකරගන්නන්, නපුරු දෙය උපදවන්නන්, මව්පියන්ට අකීකරුවන්නන්, අඥනයින්, ගිවිසුම් කඩකරන්නන්, ජන්ම සෙනෙහස නැත්තන්වද සිටියහ. මෙවැනි දෙය කරන්නන්, මරණයට සුදුසුය යන දෙවියන්වහන්සේගේ නිගමනය ඔවුහු දැනගත් නුමුත්, එම දෙයම කරති. එපමණක් නොව, එම දෙය කරන්නන් සමගද සහභාගි වෙති.

# විනිශ්චය ඉදිරියේ ඇත

### හෙබ්‍රෙව් 9:27 අ

තවද එක්වරක් මරණයත්, ඉන්පසු විනිශ්චයත් මිනිසාට නියමව තිබෙනා සේ......

### එළිදරව් 20:12, 15

මළා වූ ලොකු කුඩා අය සිංහාසනය ඉදිරියේ සිටිනවා මම දුටිමි ; පොත්ද අරිනු ලැබුවේය. ජීවන පොත වන තවත් පොතක්ද අරිනු ලැබීය. මළාහු, සිය ක්‍රියා ලෙස පොත්වල ලියන ලද දෙයින් විනිශ්චය කරනු ලැබූහ. යමෙකුගේ නම ජීවන පොතේ ලියා නැති නම්, ඔහු ගිනිවිලට හෙලනු ලැබුවේය.

### හෙබ්‍රෙව් 10:31

ජීවමාන දෙවියන්වහන්සේගේ අත්වලට හසුවීම භයානක දෙයකි.

### මතෙව් 12:36

තවද මනුෂ්‍යයන් කථා කරන සියලු නිෂ්ඵල වචන ගැන විනිශ්චය දවසේ දී ගණන් දීමට වන්නේ යයි මම ඔබලාට කියමි.

### දේශනාකාරයා 12:14

මක්නිසාද, යහපත් වේවා, නපුරු වේවා, සියලු ක්‍රියාද, සියලු රහස් දෙයද දෙවියන්වහන්සේ විනිශ්චයට පමුණුවති.

### මතෙව් 13:49, 50

ලෝකාන්තිමයේදී මෙසේම වෙයි: දේව දූතයෝ නික්ම ඇවිත් ධර්මිෂ්ඨයන් කෙරෙන් දුෂ්ඨයන් වෙන්කර ගිනි උඳුනෙහි හෙළති. එහි හැඬීමද, දත්මිටිකෑමද වෙයි.

## හිතෝපදේශ 15:3

ස්වාමින්වහන්සේගේ නෙත් සැම තැනම පැවත, නපුරන්ද යහපතුන්ද බලන්නේය.

## ගීතාවලිය 139:1–4

අහෝ ස්වාමිනි ඔබ මා විමසා බලා දැනගත්සේක. මාගේ හිඳ-ගැනීමද, නැගිටීමද ඔබ දන්නාසේක. දුරදීම මාගේ සිතුවිල්ල ඔබට තේරෙන්නේය. ඔබ මාගේ ගමනත් සයනයත් විමසා බලනසේක. මාගේ සියලු මාර්ග දන්නාසේක. මක්නිසාද ස්වාමිනි ඔබ මුළුමනින්ම නොදන්නාවූ කිසි වචනයක් මාගේ දිවේ නැත.

## ගීතාවලිය 94:9

කන පිහිටවූ එතුමාට නොඇසේද? නෙත් සෑදූ එතුමාට නොපෙනේද?

## 1 සාමුවෙල් 16:7 ආ

ස්වාමින්වහන්සේ මිනිසා බලනා සේ නොබලති; මිනිසා පිටස්තර පෙනීම බලයි, නුමුත් ස්වාමින්වහන්සේ සිත බලනසේක.

## යෙරෙමියා 16:17

මක්නිසාද මාගේ නෙත් ඔවුන්ගේ සියලු මාර්ග කෙරෙහි ඇත; ඒවා මාගේ මුහුණෙන් සැඟවී නැත. ඔවුන්ගේ අයුතුකමද මාගේ නෙත් ඉදිරියෙන් වැසී නැත.

## හෙබ්‍රෙව් 4:13

උන්වහන්සේ ඉදිරියේ ප්‍රකාශ නොවුන කිසි මැවිල්ලක් නැත. උන්-වහන්සේගේ නෙත් ඉදිරියේ සියල්ල වැස්මක් නැතිව ඇරී තිබේ. අපෙන් ගණන්ගන්නේ උන්වහන්සේය.

# පාපයෙන් හැරීම අත්‍යවශ්‍යයි

### එසකියෙල් 18:23

දුෂ්ඨයා සිය මාර්ගයෙන් හැරී ජීවත්වෙනවාට මිස, නසිනවාට කිසිසේත් මාගේ ප්‍රසන්නයක් ඇද්ද ? ස්වාමි වූ දෙවියන්වහන්සේ කියති.

### ලූක් 13:3

එසේ නොවේ යයි ඔබලාට කියමි. පසුතැවිලි නුනොත් ඔබ සියල්ලෝම එසේ විනාශ වන්නෝය.

### යෝවෙල් 2:12, 13අ

එහෙත් දැන්වත් ඔබලාගේ මුළු සිතින් ද නිරාහාරව සිටීමෙන්ද, ඇඬීමෙන්ද, වැලපීමෙන්ද මා වෙත හැරී එන්න යයි ස්වාමින්වහන්සේ කියති. එසේය, ඔබලාගේ වස්ත්‍ර නොව, නුමුත් ඔබලාගේ සිත් ඉරාගෙන ඔබලාගේ දෙවි වූ ස්වාමින්වහන්සේ වෙත හැරී එන්න.

### හොෂෙයා 14:2අ

ඔබලා, වචන රැගෙන ස්වාමීන් වහන්සේ වෙත හැරී ඇවිත් උන්වහන්සේට කථකර: අපේ සියලු අපරාධවලට සමාවී කරුණාවෙන් අප පිළිගත මැනවයි......කියන්න.

### යෝබ් 33:27, 28

උන්වහන්සේ මිනිසා දෙස බලති. කෙනෙක් මෙසේ කී විට: මම පව් කෙළෙමි......... මිනිවලට යාමෙන් ඔහුගේ ප්‍රාණය උන්වහන්සේ මුදවන සේක. ඔහුගේ ජීවිතයද ආලෝකය දකින්නේය.

**යෙසායා 55:6,7**

උන්වහන්සේ සම්භවීමට සිටිද්දී උන්වහන්සේ සොයන්න, උන්වහන්සේ ළංව සිටිද්දී උන්වහන්සේට අඬගසන්න. දුෂ්ටයා සිය මාර්ගයද, අධර්මිෂ්ඨයා සිය යෝජනාද අත්හැර **ස්වාමින්වහන්සේ** වෙත හැරී ඒවා, උන්වහන්සේ ඔහුට අනුකම්පා කරනවා ඇත. අපේ දෙවියන්වහන්සේ වෙත හැරී ඒවා, මක්නිසාද, එතුමා අතිශයින් කමාවෙනවා ඇත.

**ගීතාවලිය 32:5**

මාගේ පාපය ඔබට ප්‍රකාශ කෙළෙමි, මාගේ අයුතුකම නොසැඟවීමි. මාගේ වරද **ස්වාමින්ට** කියා දෙන්නෙමියි කීවෙමි. ඔබද මාගේ පාපයේ අයුතුකම කමා කළසේක.

**ගීතාවලිය 34:18**

**ස්වාමින්වහන්සේ** බිඳුනු සිත් ඇත්තන්ට ළංව සිටිනසේක, තැලුණු ආත්ම ඇත්තන් ගළවනසේක.

**යෙරෙමියා 36:3අ**

......මා විසින් ඔවුන්ගේ පාපය කමාකරන පිණිස, එකිනෙකා සිය නපුරු මාර්ගයෙන් හැරෙනවා ඇත.

**1 යොහන් 1:9**

අපේ පාපවල් කියා දෙමු නම්, අපේ පව් අපට කමා කරන්නටත්, සියලු අධර්මිෂ්ඨකමින් අපව පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක.

**පසුතැවිලිවීම නම්, පාපයෙන් හැරී ඒවා දෙවියන්වහන්සේට කියා දීමයි.**

# අපට දෙවියන්වහන්සේ හා සමගියට පරිත්‍යාගය අවශ්‍යයි

(පිටු 14 සමග සසඳන්න)

## ලෙවී 1:4 ; 17 : 11

ඔහු සිය අත දවන පූජා සතාගේ හිස මත තබත්වා. එය, ඔහු උදෙසා සමගිකමට ඔහු නිසා පිළිගනු ලබන්නේය. මක්නිසාද මාංසයේ ප්‍රාණය රුධිරයේ ඇත. මම එය ඔබලාගේ ප්‍රාණ උදෙසා පූජාසනය පිට සමගිකමක් කරන පිණිස ඔබලාට නියම කෙළෙමි. මක්නිසාද ප්‍රාණයට සමගිකමක් සිදු කරන්නේ ලෙයයි.

## නික්මයාම 12:5 අ, 13

ඔබේ බැටළුපැටවා කැලලක් නැති අවුරුද්දක් වූ පිරිමි සතෙක් විය යුතුයි...... ඒ ලෙය ඔබලා සිටින නිවෙස්වල ඔබලා උදෙසා ලකුණක් වන්නේය. මම ඒ ලේ දැක ඔබලා පසුකර යන්නෙමි......ඔබලා විනාශ කිරීමට පීඩාවක් ඔබලා පිට නොවන්නේය.

## උත්පත්ති 22:8අ, 13

ආබ්‍රහම් : මාගේ පුත්‍රය, දෙවියන් වහන්සේ උන්වහන්සේට දවන පූජාවක් පිණිස බැටළුපැටවෙක් සපයා ගන්නවා ඇතැයි කීවේය................ ආබ්‍රහම් ඇස් ඔසවා බැලූ විට බලන්න තමා පිටුපස බැටළුවෙක් එවුගේ අංවලින් අකුලක පැටලැවී සිටිනවා දිටීය. එවිට ආබ්‍රහම් ගොස්, ඒ බැටළුවා රැගෙන සිය පුත්‍රයා වෙනුවට දවන පූජාවක් කර ඔප්පු කළේය.

යොහන් 1:29

පසුවද තමා ළහට යේසුස්වහන්සේ එන බව දුටු යොහන් : අන්න, ලෝ පාපය දුරුකරන දෙවියවහන්සේගේ බැටළුවාණෝ යයි කීය.

යෙසායා 53:6 ආ, 7

ස්වාමින්වහන්සේද අප සියල්ලන්ගේ අයතුකම එතුමා පිට තැබූසේක. එතුමාට පීඩා කළ විට, එතුමා යටත් වී, සිය මුඛය නැර සිටීහ. මරන්ට ගෙන යන බැටළු පැටවකු මෙන් ද, බැටළුදෙනක් ලෝම-කපන්නන් ඉදිරියේ නිහඬව සිටින්නා මෙන්ද, එතුමා සිය මුඛය නැර සිටීහ.

හෙබ්‍රෙව් 9:12, 28 අ

එළුවන්ගේද, වසුපැටවුන්ගේද ලේ නිසා නොව, සිය ලේ තුළින්, අපට සදකාල මිදීම ලබා දී එකම වරක් ශුද්ධ ස්ථානයට ඇතුළු වූසේක. බොහෝ දෙනෙකුගේ පව් ඉසිලීමට එක් වරක් ක්‍රිස්තුස්වහන්සේ පූජා වූහ.

1 පේතෘස් 1 : 18 අ, 19

මක්නිසාද ......... ඔබලා මුදනු ලැබුවේ රන්රිදී වැනි දිරා යන දෙය තුළින් නොව, කැලලක් හෝ පලුද්දක් නැති බැටළුපැටවකුගේ ලේ වැනි වූ ක්‍රිස්තුස්වහන්සේගේ අනගි ලෙය තුළින් බව ඔබලා දනිති.

හෙබ්‍රෙව් 9:14

කැලලක් නැතිව, සදකාල ආත්මයානන් තුළින්, තමන්ම දෙවිතුමන්ට පූජා වූ, ක්‍රිස්තුස්ගේ ලෙයින්, ජීවමාන දෙවියන්වහන්සේට සේවයකරන පිණිස, මළ ක්‍රියාවලින් ඔබලාගේ හෘදසාක්ෂිය කොපමණ වැඩියෙන් පිරිසිදුකරනු නොලබයිද?

# මිදීම දෙවිතුමගේ සැලසීම තුල පමණකි

## රෝම 5:8, 9

නුමුත් දෙවියන්වහන්සේ, අප කෙරෙහි ඇති සිය ප්‍රේමය පෙන්වනුයේ අප පව්කරුවන්ව සිටියදීම අප වෙනුවෙන් ක්‍රිස්තුස්වහන්සේ මරණය විදීමෙන්ය. එබැවින් ඊටත් වඩා, ක්‍රිස්තුස්වහන්සේගේ ලෙය තුළ ධර්මිෂ්ඨකරනු ලැබූ අපි එතුමා නිසා දෙවියන්වහන්සේගේ උදහසින් ගළවනු ලබන්නෙමුව.

## ගලාති 2:16අ

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල තුල මිස – ව්‍යවස්ථාවේ ක්‍රියා නිසා මිනිසෙක් ධර්මිෂ්ඨකරනු නොලබනු බව දැන ......... ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි අදහාගනිමුව.

මක්නිසාද, ඇදහිල්ල තුල අනුග්‍රහයෙන් ඔබලා ගැලවී සිටිති. එය ඔබලාගෙන් නොව, දෙවියන් වහන්සේගේ දීමනාවකි. කිසිවෙකු පාරට්ටු කරගන්නා පිණිස එය ක්‍රියාවලින් නොව. —එපීස 2 : 8, 9

## ක්‍රියා 10 : 43

එතුමා තුළ අදහන සියල්ලන්ට, එතුමාගේ නාමය කරනකොටගෙන පාප කමාව ලැබෙන බවට සියලු අනාගතවක්තෘන් එතුමා ගැන සාක්ෂි දුන්හ.

## ක්‍රියා 4 :12

වෙන කිසිවෙකු තුල ගැලවීම නැත. මක්නිසාද අපේ ගැලවීමට අවශ්‍ය වූ මනුෂ්‍යයන් අතරේ දෙන ලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත.

# යේසුස්වහන්සේගේ උපත ප්‍රකාශකිරීම 

## ලූක් 1 : 26 — 38

ගලීලයේ නාසරත් නම් නුවර විසූ දවිත්ගේ වංසයේ යෝසප් නම් මනුෂ්‍යයකුට විවාහබස් දී සිටි කන්‍යාවක් වෙත දෙවියන්වහන්සේ විසින් ගාබ්‍රියෙල් නම් දූතයා යවන ලදහ. මරියා ඒ කන්‍යාවගේ නමය. දේව දූතයා ඇයට කථාකර : මරියා, භය නොවන්න, මක්නිසාද, ඔබට දෙවියන්වහන්සේගේ කරුණාව ලැබී ඇත. බලන්න, ඔබ ගැබ්ගෙන පුතෙකු ප්‍රසූත කරන්නේය. එතුමාට යේසුස් යන නාමය තබන්න. එතුමා උතුම්ව මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණන් යයි කියනු ලබති... එතුමාගේ රාජ්‍යයේ කෙළවරක් නැත. එවිට මරියා දේවදූතයාට කථාකර : මා පිරිමියෙකු නැඳින සිටින බැවින්, මෙය වන්නේ කෙසේදැයි කීවාය. දේවදූතයා ඇයට උත්තර දෙමින්: ශුද්ධාත්මයාණන් ඔබ කෙරෙහි පැමිණෙනසේක. එතුමාණන්ගේ ආනුභාවය ඔබව වසා ගන්නේය. එමනිසා උපදින්ට සිටින තැනැත්තා ශුද්ධය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් යයි කියනු ලබති...... දෙවියන්වහන්සේට කිරීමට නුපුළුවන් දෙයක් නැත. මරියාද, බැලුව මැනව, ස්වාමින්වහන්සේගේ දසිය ; ඔබගේ වචනය ලෙස මට වේවා කීය. එවිට දේවදූතයා ඈ කෙරෙන් ගියේය.

---

ලිංගික සබඳතාවයක් නැතිව ලෝ පහලවූ එකම මිනිසුන් ආදම් හා ක්‍රිස්තුස්ය. ආදම් ලොවට පාපය ගෙන ආවේය. නුමුත් ක්‍රිස්තුස් පාපයෙන් ජය ගෙනාහ.

**පිලිප්පි 2 : 6, 8**

එතුමා දෙවියන්වහන්සේගේ හැඩ-රුව දරූ නිසා දෙවියන්වහන්සේට සමානව සිටීම වරදකයි නොසිතා...... මනුෂ්‍යාකාරයෙන් සිටිය කල, මරණය, එසේය, කුරුසියේ මරණය දක්වා යටහත් වූසේක.

**යොහන් 10: 30, 36**

මමද පියාණන්ද එක් තැනැත්තෙකි. මා දෙවියන්වහන්සේගේ පුත්‍රයා යයි කී නිසා, පියාණන්වහන්සේ විසින් කැපකර, ලෝ එවූ තැනැත්තා ගැන මා දෙවියන්වහන්සේට අපහාස කරන්නේ යයි ඔබලා කියන්නහුද?

---

සදකාලික වචනය වන යේසුස් ක්‍රිස්තුස් සැමවිටම පැවතුනාහ. **හාස්කමකින්** මරියා තුල එතුමා ගැබ්ගැනීමට දෙවියන්වහන්සේ සැලසූහ. මාංසාකාරයෙන් එතුමා මනුෂ්‍ය පුත්‍රයා යනුවෙන් හැඳින්විය. ආත්මිකව දේව පුත්‍රයා යනුවෙන් හැඳින්විය. දෙවියන්වහන්සේ එතුමාගේ වචනය වන යේසුස් ක්‍රිස්තුස් සමග ඇති නෑකම තෝරදීම පිණිස, ''පුත්‍රයා'' කියා ශුද්ධලියවිල්ල ප්‍රකාශ කරයි.

**හෙබ්‍රෙව් 10 : 5**

එතුමා ලෝ එන විට කථාකර .... ශරීරයක් මට සූදනම්කර දුන්සේක.

ශුද්ධකමේ ආත්මයේ ප්‍රකාරයට දේවපුත්‍රයාණන් හැටියට මළවුන්-ගෙන් නැගිටීම තුළ බලයෙන් යුතුව ප්‍රකාශ කරනු ලැබූහ. —රෝම 1 : 5 ආ

**යොහන් 20 : 28**

මාගේ ස්වාමිනි, මාගේ දෙවියනි, තෝමස් එතුමාට කීසේක.

# සැබවින්ම යේසුස්වහන්සේ කවුරුහුද 

**1 තිමොති 3 : 16 අ**

දේව භක්තියේ රහසද නිසැකවම මහත්ය; දෙවියන්වහන්සේ මාංසයෙන් ප්‍රකාශ වූහ.

**කොලොස්සි 2 : 9**

මක්නිසාද එතුමා තුල දේවත්වයේ සියලු සම්පූර්ණකම ශරීරාකරයෙන් වාසය කරයි.

**යෙසායා 9 : 6**

මක්නිසාද අපට ළදරුවෙක් උපන්නේය; අපට පුත්‍රයෙක් දෙන ලද්දේය ; ආණ්ඩුවද එතුමා කරපිට තිබෙන්නේය. එතුමාගේ නාමය: අපූර්වය, මන්ත්‍රීවරයාය, පරාක්‍රමවත් දෙවියන්වහන්සේය, සදාකාල පියාණන්ය, සාමයේ කුමාරයානන්ය කියනු ලබන්නේය.

**කොලොස්සි 1 : 14 ,15 අ**

එතුමා තුළ අප මිදීම වන පව්වලට කමාව අපට ඇත. එතුමා අදෘෂමාන දෙවියන්වහන්සේගේ ස්වරූපයයි.

**යොහන් 1 : 4, 9–10**

එතුමා තුළ ජීවනය විය. ඒ ජීවනය මිනිසාගේ ආලෝකය විය. ලෝ එන සියලු මිනිසුන් ආලෝකය කරන ඒ ආලෝකය සැබෑ වූ ආලෝකයයි. එතුමා ලෝ සිටීහ. ලොවද එතුමා විසින් සාදන ලදහ. නමුත් ලෝකයා එතුමා නැඳින්නේය.

**1 තිමොති 2 : 5, 6**

ඇත්තේ එකම දෙවිකෙනෙකි. දෙවිතුමටත් මිනිසාටත් අතර මැදහත්කාරකම් කරන එකම මැදහත්කරුවෙකි. එතුමා සියල්ලන් උදෙසා මිදීමේ මිලයක්වූ ...ක්‍රිස්තුස් යේසුස්ය.

# බයිබලය (ශුද්ධ ලියවිලි) දෙවිතුමගේම වචනයයි

## 2 පේතෘස් 1 : 21

මක්නිසාද කිසි අනාගතවාක්‍යයක් මිනිස් කැමැත්තෙන් කිසි කලෙක නොපැමිණියේය. නුමුත් මනුෂ්‍යයන් ශුද්ධාත්මයාණන් විසින් පොළඹවනු ලැබ දෙවියන්වහන්සේගෙන් ලත් ලෙස කථා කළහ.

## ලූක් 1 : 69, 77 ආ

ලෝ පටන්ගැන්මේ සිට විසූ සිය ශුද්ධවූ අනාගතවක්තෘන්ගේ මුඛයෙන් කියෙවූ ලෙස ... එතුමාගේ සෙනඟට පව් කමා වීමෙන් ලැබෙන ගැලවීම දැන්වීමටය.

## ඊතීය 6 : 6

මා විසින් අද ඔබට අණ කරන මෙම වචන ඔබේ සිතේ තිබෙත්වා.

## 2 සාමුවෙල් 23 : 2

ස්වාමින්වහන්සේගේ ආත්මය මා තුළින් කථා කළසේක, එතුමාගේ වාක්‍යයද මාගේ දිවේ තිබුණේය.

## රෝම 15 : 4

මක්නිසාද, ඉවසිල්ල තුළින් ද, ලියවිලිවලින් හටගන්නා සැනසිලී තුළින්ද අප බලාපොරොත්තු ඇතිව සිටින පිණිස පූර්වයෙහි ලියන ලද සියල්ල අප ඉගෙනීම සඳහා ලියන ලදි.

## මතෙව් 22 : 29 ආ

ඔබලා ශුද්ධ ලියවිලි හෝ දේව බලය නොදැන වරද්දගතිහුය.

## ගීතාවලිය 138 : 2 ආ

ඔබෙගේ මුළු නාමයට ඉහළින් ඔබගේ වචනය උතුම් කළසේක.

### එළිදරව් 19 : 13

තවද එතුමා ලේ ඉසිනු ලද වස්ත්‍රයක් පැළඳ සිටීහ. එතුමාගේ නාමය දෙවියන්වහන්සේගේ වාක්‍යාණෝ යයි (දේව වචනය) කියනු ලැබේ.

### යොහන් 1 : 1, 14 අ

පටන්ගැන්මේ දී වාක්‍යාණෝ සිටිසේක, වාක්‍යාණෝ දෙවියන් වහන්සේ සමග සිටිසේක, වාක්‍යාණෝ දෙවියන්වහන්සේව සිටිසේක. තවද වාක්‍යාණෝ මාංසවත් වී... අප අතරේ වාසය කළසේක.

යේසුස් දෙවියන්වහන්සේව එළිදරව් කරති

### 2 කොරින්ති 4 : 6

එසේය, යේසුස් ක්‍රිස්තුස්ගේ මුහුණෙහි දේව තේජස දැනගැන්ම නැමති ආලෝකය බැබළෙන පිණිස, අපගේ සිත්වල බැබලුවේ අඳුරෙන් ආලෝකය බැබළෙන්නට කියූ දෙවියන්වහන්සේය.

### යොහන් 1 : 18

කිසිවෙක් කිසිකලෙක දෙවියන් වහන්සේ දැක නැත. පියාණන්ගේම ළයේ සිටින ඒකජාතක පුත්‍රයාණන්ම එතුමාව ප්‍රකාශ කළසේක.

### යොහන් 8 : 38 අ

මාගේ පියාණන් ළඟ ඇති දුටු දෙය මම කථා කරමි.

# ලියූ හා ජීවමාන වචනය සැසඳීම

## බයිබලය ආත්මයට ආහාරය වෙයි

### යෝබ 23 : 12අ

මාගේ චුවමනා ආහාරයට වඩා එතුමාගේ මුඛයේ වචන අගේ කර තබාගතිමි.

### මතෙව් 4 : 4

මිනිසා දෙවියන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන සියලු වචනවලින් ජීවත්වෙනවා මිස රොටිවලින් පමණක් ජීවත් නොවෙයි.

## බයිබලය අප මාවත ආලෝක කරයි

### ගීතාවලිය 119 : 130

ඔබගේ වචන අනාවරණය වීමෙන් ආලෝකය ලැබේ. එයින් නුවණ නැත්තන්ට අවබෝධය ලැබේ.

## ස්වර්ගීය ආහාරය යේසු වෙයි

### යොහන් 6 : 51, 48

ස්වර්ගයෙන් බැස ආ ජීවමාන ආහාරය මමය. යමෙක් මෙම ආහාර කෑවිට ඔහු සදකල් ජීවත් වෙයි. එසේය ලෝකයාගේ ජීවනය පිණිස මා විසින් දෙනු ලබන ආහාරය නම් මගේ මාංසය වෙයි. ඒ ජීවමාන ආහාරය මමය.

## ලොවට ආලෝකය යේසු වෙයි

එතුමා තුල ජීවනය තිබුණේය ; ඒ ජීවනය මිනිසාගේ ආලෝකය විය. යේසුස්වහන්සේ නැවත ඔවුන්ට කථා කර : මම ලෝකයේ ආලෝකයයි. මා අනුව එන්නා අඳුරේ නොහැසිර, ජීවනයේ ආලෝකය ලබන්නේ යයි කීසේක. —යොහන් 1 : 4; 8 : 1

බයිබලය පලදායික ජීවනයක් ගෙන දෙයි

**ගීතාවලිය 1:2, 3**

ස්වාමින්ගේ ව්‍යවස්ථාවේ ප්‍රීති වන, එතුමාගේ ව්‍යවස්ථාව දිවා රෑ මෙනෙහි කරන මිනිසා ආශිර්වාද ලද්දේය. ඔහු දිය ඇළි අසල පැල කළ නිසි කලට ඵල දෙන, මැල නොවෙන කොළ ඇති ගසකට සමාන වෙයි. ඔහු කරන සියල්ල සඵල වෙයි.



මා තුළ පවතින්න, මමද ඔබලා තුළ පවතිමි. අත්ත මිදි වැලේ නොපවතී නම්, තනියම ඵල දැරීමට බැරි ලෙස, ඔබලා මා තුළ නොපවතී නම්, ඵල දැරීමට ඔබලාට නුපුළුවන. මිදිවැල මමය, අතු ඔබලාය. යමෙක් මා තුළ පවතියිද, මමද ඔහු තුළ පවතීද ඒ තැනැත්තා බොහෝ ඵල දරයි. මගෙන් වෙන්ව කිසිත් කිරීමට ඔබට බැරිය. —**යොහන් 15:4, 5**

# ශුද්ධ ලියවිලි යේසු ගැන ප්‍රකාශ කරයි

**යොහන් 5:39, 46**

ලියවිලි සොයා බලන්න. ඒවායේ සදාකාල ජීවනය තිබේ යයි ඔබලා සිතන්නේය. ඒවා මා ගැන සාක්ෂි දරයි.......ඔබලා මෝසෙස්ව විශ්වාශ කරන්නේ නම්, මාවද විශ්වාස කළ යුතුයි. මන්ද ඔහු ලීවේ මා ගැනය.

**ලූක් 24:27**

මෝසෙස්ගෙන් හා සියලු අනාගත-වක්තෘන්ගෙන් පටන්ගෙන, සියලු ලියවිලිවල තමන් ගැන තිබූ කරුණු ඔවුන්ට තෝරා දුන්සේක.

# සදාකාලික දේව වචනය වෙනස් නොවේ

### ගීතාවලිය 119 : 89, 160

ස්වාමිනි සදාකල්හිම ඔබගේ වචනය ස්වර්ගයේ පිහිටා තිබේ. පටන්ගැන්මේ සිට ඔබගේ වචනය සත්‍යය වේ. ඔබගේ සියලු ධර්මිෂ්ඨ විනිශ්චයන් සදාකල්හිම පැවතෙයි.

### යෙසායා 40 : 8

තණ වියළෙයි මල පරවෙයි, නුමුත් අපේ දෙවියන්වහන්සේගේ වචනය සදාකල්හිම පැවතෙයි.

## මිනිසා බයිබලය වෙනස් නොකළ යුතුයි

### ද්විතීය 12 : 32

මා විසින් අණ කරන සියලු දෙය කිරීමට බලාගන්න. ඔබ ඊට කිසිවක් එකතු නොකළ යුතුය, එයින් කිසිවක් අඩු නොකළ යුතුය.

### යොහන් 10 : 35 ආ

ලියවිල්ල කැඩීමට නුපුළුවන

### හිතෝපදේශ 30 : 6

එතුමා ඔබට තරවටු නොකරන පිණිසත් ඔබ බොරුකාරයෙක් නොවන පිණිසත්, එතුමාගේ වචනවලට කිසිවක් එකතු නොකරන්න.

### එළිදරව් 22 : 19 අ

යමෙක් මෙම අනාගත වාක්‍යය පොතේ වචනවලින් යමක් අහක් කරන්නේ නම් ... ජීවන පොතෙන් ඔහුගේ කොටස දෙවියන්වහන්සේ අහක් කරනසේක.

### හිතෝපදේශ 13 : 13 අ

දේව වචනය සුළු කරන්නාට විනාශය පැමිණෙයි.

# යේසුස්වහන්සේගේ මරණය දේව සැලැස්ම පූර්ණ කළේය

### යොහන් 10 : 17, 18 ආ

මා විසින් නැවත ගන්නා පිණිස මාගේ ප්‍රාණය දෙන බැවින් මාගේ පියාණන් මට ප්‍රේම කරති. කිසිවෙක් එය මගෙන් උදුරාගන්නවා නොව, මමම එය දෙමි. එය දීමට මට බලය තිබේ. නැවත ගැනීමටද මට බලය තිබේ.

### යොහන් 19 : 11 අ

යේසුස්වහන්සේ උත්තර දෙමින් : ඉහළින් ඔබට එය දෙන නොලද්දේ නම්, මට විරුද්ධව ඔබට කිසි බලයක් නැත.

### මතෙව් 26 : 53, 54

දේව දූතයන් ලෙගියොන් 12 කට වඩා මා ළඟට මේ දැන් එවන ලෙස මාගේ පියාණන්ගෙන් ඉල්ලීමට මට බැරියයි ඔබ සිතනවාද ? එසේ ඉල්ලූ විට මෙයාකාර වීමට ඕනා යයි කියන ලියවිලි සම්පූර්ණ වන්නේ කෙසේද?

### ක්‍රියා 3 : 18

නුමුත් ක්‍රිස්තුස් විඳිනසේකැයි දෙවියන්වහන්සේ සියලු අනාගතවක්තෘන්ගේ මුඛයෙන් පෙර දැන් වූ දෙය මෙසේ සම්පූර්ණ කළසේක.

### ක්‍රියා 2 : 23

දෙවියන්වහන්සේගේ නියමවූ මන්ත්‍රණය සහ පෙරදැනගැන්ම ලෙස බාර දුන් කුරිරු අය තුළින් එතුමාව කුරුසියෙහි ඇණගස්වා මැරූහ.

# 32 යේසුගේ මරණය සාක්ෂිකරුන් වාර්තා කළහ

### මතෙව් 27 : 45, 50–51, 54

හය වන පැය සිට නව වන පැය දක්වා දේශය පුරා අන්ධකාරයක් විය ... යේසුස්වහන්සේ නැවතත් මහත් හඬකින් හඬ නගා ආත්මය හළසේක ... පොලොව කම්පා විය, පර්වත පැලුණේය; සියයකට මුලාදෑනියාද ඔහු හා යේසුස්වහන්සේ රැකවල් කරමින් සිටි අයද, පොලෝ කම්පාවද, සිදුවූ දෙයද දැක, ඉතා බියව: සැබවින්ම, මෙතුමා දෙවියන් වහන්සේගේ පුත්‍රයා යයි කීහ.

### යොහන් 19 : 32–37

හේවායෝ පැමිණ, පලමුවැනියාගේද, ඔහු හා ඇණගසුණු ලත් අනිත් අයගේද කෙණ්ඩා බින්දහ. නුමුත් ඔවුහු යේසුස්වහන්සේ ළඟට ආ කළ, එතුමා මැරී සිටි බව දැක, එතුමාගේ කෙණ්ඩා නොබින්දහ. එසේ වුව ද, එක් හේවායෙක්, එතුමාගේ ඇළයට හෙල්ලකින් ඇන්නේය. එකනෙහිම ලේද, වතුරද නික්මුණේය. ඒ දුටු තැනැත්තේ සාක්ෂි දී තිබේ. ඔහුගේ සාක්ෂිය සැබෑය. ඔබලාද විශ්වාස කරන පිණිස, තමා සැබෑව කියන බව ඔහු දනියි. මක්නිසාද, මේ දෙය සිදුවුණේ: උන්වහන්සේගේ කටුවක්වත් බිඳුනු නොලබන්නේ යයි ලියා ඇති ලියවිල්ල සම්පූර්ණ වන පිණිසය. නැවතත්: ඔවුන් විසින් අනින ලද තැනැන්වහන්සේ දෙස ඔවුහු බලන්නෝ යයි වෙන ලියවිල්ලක ලියා තිබේ.

### ක්‍රියා 2 : 24, 32

නුමුත් දෙවියන්වහන්සේ, මරණ වේදනාවෙන් උන්වහන්සේ මුද, නැගිටෙවූසේක. කුමක් හෙයින්ද උන්වහන්සේව නවතාගෙන සිටීමට මරණයට නුපුළුවන් විය. මෙම යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ විසින් නැගිටෙවූසේක, අප සියල්ලෝම එයට සාක්ෂිකාරයෝය.

### හෙබ්‍රෙව් 2 : 14, 15

එහෙයින් දරුවන් ලේ හා මාංසයට පංගුකාරයන්ව සිටින නිසා, උන්වහන්සේත් එම ආකාරයෙන් ඒවට පංගුකාරයෙක් වූහ. එසේ කළේ මරණය කෙරෙහි බලය ඇත්තා, යක්ෂයාව, මරණය තුළින් බලය නැතිකර, ජීවිතය මුළුල්ලේ මරණයට බියෙන් වහල්කමට යටත්ව සිටි සියල්ලන්ව නිදහස් කරන පිණිසය.

### 1 කොරින්ති 15 : 54 ආ, 55, 57

එම්බා මරණය තාගේ කටුව කොතැනද ? එම්බා මරණය තාගේ ජය කොතැනද ? නුමුත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් අපට ජය දෙන දෙවියන් වහන්සේට ස්තුති වෙත්වා.

### 2 තිමොති 1 : 10

මරණය නැතිකර ජීවනයත්, අමරණීයත්වයත්, සුභාරංචිය තුළින් එළිදරව් කළ අප ගැලවුම්කරු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රකාශ වීමෙන් ඒ කරුණාව දැන් ප්‍රකාශ වී තිබේ.

## එළිදරව් 3 : 20

මෙන්න, මම දෙර ලහ සිට තට්ටු කරමි. යමෙක් මාගේ හඬ අසා දෙර අරී නම්, මම ඔහු තුලට ඇතුල්ව ඔහු සමග කෑම කන්නෙමි. ඔහුද මා සමග කන්නේය.

## රෝම 4 : 5

නුමුත් වැඩ නොකරන, අභක්තික අය ධර්මිෂ්ඨකරන තැනැන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන අයට, ඔහුගේ එම ඇදහිල්ල ධර්මිෂ්ඨකර ගණන්ගනු ලැබේ.

## යොහන් 20 : 22 ආ; 16 : 24 ආ

ශුද්ධාත්මයාණන් පිලිගන්නා . . . . ඔබලාගේ ප්‍රීතිය සම්පූර්ණ වන පිණිස ඉල්ලන්න. එවිට ඔබලට ලැබෙන්නේය.

## රෝම 10 : 9

යේසුස්, ස්වාමින් බව ඔබේ මුඛයෙන් ප්‍රකාශ කරන්නේ නම්, දෙවියන්වහන්සේ විසින් එතුමාව මළවුන්ගෙන් නැගිටෙවූ බව සිතින් අදහන්නේ නම්, ඔබ ගලවනු ලබන්නේය.

## මතෙව් 10 : 37අ; 16 : 24, 25

මට වඩා පියාටත් මවටත් ප්‍රේම කරන්නා, මට සුදුසු නොවේ . . . එවිට යේසුස්වහන්සේ ගෝළයින්ට කථාකර : යමෙක් මා අනුව ඒමට කැමති නම්, ඔහු තමාව නොසළකා සිය කුරුසිය රැගෙන, මා අනුව එත්වා. මක්නිසාද යමෙක් සිය ජීවිතය ගළවා ගැනීමට කැමති වෙත්ද ඔහුට එය නැති වෙයි. මා නිසා සිය ජීවිතය නැති වන අයට, එය සම්භවෙයි.

ඒ සාක්ෂිය නම්, දෙවියන්වහන්සේ අපට සදකාල ජීවනය දුන් බවය. ඒ ජීවනය සිය පුත්‍රයා තුල තිබේ. පුත්‍රයාණන් ඇත්තාට ඒ ජීවනය ඇත; දෙවියන්වහන්සේගේ පුත්‍රයා නැත්තාට ඒ ජීවනය නැත. —1 යොහන් 5 : 11, 12

**එපීස 2 : 4, 5**

නුමුත් දයාවෙන් පොහොසත්ව සිටින දෙවියන්වහන්සේ . . . අප වැරදි නිසා අප මැරී සිටි කල පවා, ක්‍රිස්තුස්වහන්සේ හා අප ජීවත් කළහ. (කරුණාව නිසා ඔබලා ගැලවී සිටිති).

**ගලාති 2 : 20අ, ඇ**

මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසා ඇත; එහෙත් මම ජීවත්වෙමි. නුමුත් මම නොව, ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත්වෙත්. මා දැන් මාංසයෙහි ජීවත් වන ජීවිතය . . . දෙවියන්වහන්සේගේ පුත්‍රයා කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි.

**රෝම 8 : 2**

මක්නිසාද, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ජීවමාන ආත්මයාණන්ගේ ව්‍යවස්ථාව, පාපයෙන්ද, මරණයේ ව්‍යවස්ථාවෙන්ද මා නිදහස් කළේය.

**2 කොරින්ති 5 : 17**

එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුල සිටී නම්, ඔහු අලුත් මැවිල්ලකි. පරණ දෙය පහව ගියේය, මෙන්න සියල්ල අළුත් වී තිබේ.

**පේතෘස් 1 : 23; 2 : 2**

මක්නිසාද ඔබලා කුනුවෙන බීජවලින් නොව, දෙවිතුමගේ ජීවමාන, සදහටම පවතින වචනය තුලින් කුනුනොවන බීජවලින් නැවත උත්පාදකරනු ලැබූහ.

# 36 සිය සෙනඟට දෙවියන්වහන්සේ පියෙකි

**ගීතාවලිය 68 : 5**

සිය ශුද්ධ නිවසේ සිටින දෙවියන් වහන්සේ පියෙක් නැත්තන්ට පියෙකි; වැන්දඹුවන්ට විනිශ්චය කාරයෙකි.

**යෙසායා 64 : 8; 63 : 16ආ**

ඉතින් **ස්වාමිනි,** ඔබ අප පියාය; අප මැටිය, ඔබ අප කුම්භකරුය. අප සියල්ලන්ම ඔබේ හස්ත කර්මාන්තයය. **ස්වාමිනි,** ඔබම අප පියාය, අප මිදුම්කරුය. සදාකාලයේ සිට එය ඔබ නාමයයි.

**මතෙව් 7 : 11; 6 : 9**

මෙසේ නපුරුවූ ඔබලා, ඔබලාගේ දරුවන්ට යහපත් දෙය දීමට දනිත් නම්, ස්වර්ගයේ සිටින ඔබලාගේ පියාණන්, එතුමාගෙන් ඉල්ලන්නන්ට කොපමණ වැඩියෙන් යහපත් දෙය දෙනසේක්ද ? . . . . . එහෙයින් ඔබලා මෙසේ යාඥා කරන්න: ස්වර්ගයේ සිටින අපගේ පියාණෙනි, ඔබගේ නාමයට ගෞරවය වේවා.

**හොෂෙයා 1 : 10ආ**

තවද, ඔබලා මාගේ සෙනඟ නොවේ යයි ඔවුන්ට කියූ ස්ථානයේදීම, ජීවමාන දෙවියන්ගේ පුත්‍රයෝ යයි ඔවුන්ට කියනු ලැබේ.

**2 කොරින්ති 6 : 17ආ, 18**

එවිට, මම ඔබලා පිළිගෙන, ඔබලට පියෙක් වෙමි; ඔබලාද මට පුත්‍රයෝත්, දූවරුත් වෙතියි සර්වපරාක්‍රම ස්වාමීන් කියනසේක.

**රෝම 8 : 14**

දෙවිතුමගේ ආත්මයාණන් විසින් ගෙන යනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද, ඔවුන් දේව පුත්‍රයෝ වෙති.

# යේසු තුළින් දෙවිතුම පියාණන් බව අපි දනිමු 

### යොහන් 14 : 6, 7, 23 ආ

යේසුස්වහන්සේ ඔහුට කියනසේක්: මාර්ගයද, සැබෑවද, ජීවනයද, මමය. මා තුළින් මිස, කිසිවෙක් පියාණන් වෙත පැමිණෙන්නේ නැත. ඔබලා මා ඇඳින්නේ නම්, මා පියාණන්වද අඳුනනවා ඇත. මෙතැන් සිට ඔබලා එතුමා අඳුනති, දැක ද තිබේ. යමෙක් මට ආදරේ නම්, ඔහු මාගේ වචන රකින්නේය. මාගේ පියාණන්ද ඔහුට ප්‍රේම කරනසේක. අප ඔහු වෙත පැමිණ ඔහු හා වාසය කරමු.

### ගලාති 4 : 4–7; 3 : 26

දෙවියන්වහන්සේ . . . . සිය පුත්‍රයා එවූහ. එසේ කළේ අප විසින් පුත්‍රකම ලබන පිණිසය . . . . තවද ඔබලා පුත්‍රයන්ව සිටින බැවින් : අබ්බා පියාණෙනි කියා හඬගසන සිය පුත්‍රයාගේ ආත්මය අප සිත්වලට එවූහ. මෙසේ ඔබ දසයෙක් නොව, නුමුත් පුත්‍රයෙකි; පුත්‍රයෙක් නම්, ක්‍රිස්තුස් තුළින් දෙවියන්වහන්සේගේ උරුමක්කාරයෙකි. මක්නිසාද, ඔබ සියල්ලෝම ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුල ඇදහිල්ල කරනකොටගෙන දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය.

### යොහන් 1 : 12

නුමුත් යම් පමණ දෙනෙක් එතුමව පිලිගත්ද, එනම්, එතුමගේ නාමය කෙරෙහි අදහාගත්ද, දෙවියන්වහන්සේගේ දරුවන් වීමට එතුමා ඔවුන්ට බලය දුන්හ.

## 38 ප්‍රේමය, සතුට සාමය යේසුස් ගෙන එයි

**1 යොහන් 4 : 8, 16ආ**

ප්‍රේම නොකරන්නා දෙවියන්වහන්සේ නාඳුනයි; මක්නිසාද, දෙවියන්වහන්සේ ප්‍රේමයයි. . . . . දෙවියන්වහන්සේ ප්‍රේමයයි, ප්‍රේමයේ පවතින්නා දෙවියන්වහන්සේ තුළ සිටී, දෙවියන්වහන්සේද ඔහු තුළ සිටිති.

**එපීස 4 : 32**

ඔබලා එකිනෙකා කෙරෙහි කරුණාවන්තව, මෘදු සිත් ඇතිව, ක්‍රිස්තුස් තුළ දෙවියන්වහන්සේ ඔබලාට කමාවුන ලෙස ඔබලා ද එකිනෙකාට කමා වෙන්න.

**යොහන් 13 : 35**

ඔබලා එකිනෙකාට ප්‍රේම කරත් නම්, ඔබලා මාගේ ගෝලයන් බව, එයින් සියල්ලන්ම දැනගන්නවා ඇත.

**ගලාති 5 : 22අ**

නමුත් ආත්මයාණන්ගේ ඵල නම්, ප්‍රේමය, සතුට, සාමය . . . .

**හබක්කුක් 3 : 18**

මම ස්වාමීන් කෙරෙහි ප්‍රීති වෙමි; මාගේ ගැලවීමේ දෙවියන් කෙරෙහි ප්‍රීති වෙමි.

**ගීතාවලිය 16 : 11**

ඔබ මට ජීවනයේ මග පෙන්වති. ඔබ අභිමුඛයේ ප්‍රීතියේ පූර්ණත්වය ඇත; ඔබගේ දකුණු පසෙහි සදාකාලයටම සැපත ඇත.

**රෝම 5 : 1**

එබැවින්, ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨ කරනු ලැබ, අප ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් තුලින් දෙවියන්වහන්සේ හා සාමය ඇතිව අපි සිටිමු.

# සිය සැබෑ අනුගාමිකයන්ව යේසු නැවත නැගිටවනසේක

**රෝම 8 : 11**

තවද, යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිට වූ තැනැන්වහන්සේගේ ආත්මයාණන් ඔබලා තුල වාසය කරත් නම්, ක්‍රිස්තුස් යේසුස්ව මලවුන්ගෙන් නැගිට වූ තැනැන් වහන්සේ, ඔබලා තුළ වෙසෙන සිය ආත්මයාණන් විසින් ඔබලගේ මරණීය ශරීරද ජීවත් කරනසේක.

**1 කොරින්ති 6 : 14**

දෙවියන්වහන්සේ ස්වාමින්ව නැගිටවූහ. අපවද සිය බලයෙන් නැගිටවනසේක.

**යොහන් 6 : 40**

මක්නිසාද, මාගේ පියාණන්ගේ කැමැත්ත, පුත්‍රයාණන් බලා ඔහු කෙරෙහි අදහන සැමදෙනම සදකාල ජීවනය ලැබීමය; මමද අන්තීම දිනදී ඔහු නැගිටවන්නෙමි.

**1 කොරින්ති 15 : 21–23**

මක්නිසාද මනුෂ්‍යයෙකු නිසා මරණය පැමිණුන හෙයින්, මනුෂ්‍යයෙකු නිසා මලවුන්ගෙන් නැගිටීමත් පැමිණුනේය. ආදම් තුල සියල්ලන්ම මැරෙනා සේ ක්‍රිස්තුස් තුල සියල්ලෝම ජීවත්කරනු ලබති. නුමුත් එක් එක් අය, තම තමාගේම සැටියටය. ක්‍රිස්තුස් නාඹුල් ඵලයය. ඉන්පසු ක්‍රිස්තුස්ගේ ඊමේ දී එතුමා සන්තක වූවෝය.

මා ජීවත් වන නිසා, ඔබලත් ජීවත් වන්නෝය. —යොහන් 14 : 19ආ

# මෙම මහත් ගැලවීම නොසලකා නාරින්න

**හෙබ්‍රෙව් 10 : 28, 29**

මොසස්ගේ ව්‍යවස්ථාව සුළු කළ අය දෙදෙනෙකු හෝ තිදෙනෙකුගේ සාක්ෂි මත කරුණාව නොලැබ මරණයට පත් කළහ. ඔබලා කුමක් සිතන්නේ ද, දේව පුත්‍රයාණන් පාගා දමා, තමා පිරිසිදු කළ ගිවිසුමේ ලෙය අශුද්ධ දෙයක් ලෙස සිතා අනුග්‍රහයේ ආත්මයාණන්ට අපහාස කළ තැනැත්තා ඊට වඩා මහත් දඬුවමකට සුදුස්සෙක් කර ගණන්ගනු නොලබන්නේ ද ?

**යොහන් 8 : 24**

එහෙයින් ඔබලගේ පාපයේම ඔබලා නසිනවා ඇතැයි ඔබලට කියමි. එතුමා මම යයි ඔබ අවිශ්වාස කළ විට, ඔබලගේ පාපයේම ඔබලා නසිනවා ඇත.

**යොහන් 12 : 48**

මා එපා කර, මාගේ වචනය පිළිනොගන්නාව විනිශ්චය කරන්නෙක් සිටියි. මා කී වචනම අන්තිම දින දී ඔහුව විනිශ්චය කරයි.

මාගේ මිතුරෙනි, ශරීරය නසා, ඉන්පසු වෙන කිසිවක් කිරීමට බැරි අයට බිය නොවෙන්න යයි ඔබලට මම කියමි. නමුත් ඔබලා බිය විය යුතු කා හටදැයි ඔබලට පෙන්වමි. නැසූ පසු නිරයෙහි හෙළීමට බලය ඇති එතුමට බිය වෙන්න; එසේය එතුමටම බිය වෙන්න යයි ඔබලට කියමි. —**ලූක් 12 : 4, 5**

මෙපමණ මහත් ගැලවීම අපි නොසළකා සිටි විට කෙසේ ගැලවෙමුද ? —**හෙබ්‍රෙව් 2 : 3අා**

### ක්‍රියා 17 : 31

මක්නිසාද, එතුමා විසින් පත් කල මිනිසා විසින්, ලෝකයා ධර්මිෂ්ඨ කමින් විනිශ්චය කිරීමට එක් දිනක් නියම කර තිබේ; එතුමා ඒ මිනිසා මළවුන්ගෙන් නැගිටවීමෙන් සැමට ඒ ගැන සහතිකයක් දී තිබේ.

### යොහන් 5 : 22, 23අ

තවද සියල්ලන් විසින් පියාණන්ට ගෞරවය කරනා සේ, පුත්‍රයාටත් ගෞරවය කරන පිණිස, පියාණන් කිසිවකුට විනිශ්චය නොකර, සියලු විනිශ්චය පුත්‍රයාට දී තිබේ.

එසේ වුවද, මා ඔවුන් කෙරෙහි රජකම් කරනවාට අකමැති වූ මේ මාගේ සතුරන් මෙහි ගෙනැවිත්, මා ඉදිරියේ මරා දමව්. —ලූක් 19 : 27

### 2 තෙසලෝනික 1 : 67

කුමක්හෙයින්ද, ස්වාමිවූ යේසුස් . . . ඇවිලෙන ගින්නෙන් යුතුව ස්වර්ගයෙන් එළිදරව් වී, දෙවියන් වහන්සේ නාඳුනන්ටත්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්ගේ සුභාරංචියට කීකරු නොවන්නන්ටත් ප්‍රතිඵල දෙන කල . . . . .

දෙවියන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස් විසින් මිනිසාගේ රහස් විනිශ්චය කරන දින දී . . . . රෝම 2 : 16අා

### 2 කොරින්ති 5 : 10

මක්නිසාද, එකිනෙකා . . . යහපත් හෝ අයහපත් වුවද, කළ දෙය හැටියට ලබන පිණිස, අප සියල්ලෝම ක්‍රිස්තුස්ගේ විනිශ්චය අසුන ඉදිරියේ ප්‍රකාශවෙන්න ඕනෑය.

# යේසුගේ අනුගාමිකයන් යයි ප්‍රකාශ කරන සියල්ලෝම යේසුට අයිති නොවෙති

**තීතස් 1 : 6**

ඔවුහු දෙවියන්වහන්සේව අඳුනන බව කියති; නුමුත් . . . . සිය ක්‍රියාවලින් එතුමා නාඳුනන බව ප්‍රකාශ කරති.

ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන් යම් කෙනෙකුට නැත්නම්, ඔහු එතුමාට අයිති නැත. —රෝම **8 : 9**ආ

**එසකියෙල් 33 : 31**ආ

මාගේ සෙනඟ මෙන් ඔබ ඉදිරියේ හිඳ ඔබේ වචන අසති, නුමුත් ඔවුහු ඒවා නොපවත්වති. මක්නිසාද, සිය මුඛයෙන් ඔවුහු බොහෝ ආදරය පෙන්වතත්, ඔවුන්ගේ සිත, ඔවුන්ගේ ලාබය පසුපස යයි.

මෙම සෙනඟ මට දෙතොලින් ගරු කරති; නුමුත් ඔවුන්ගේ සිත, මා කෙරෙන් දුරුව තිබේ. —මතෙව් **15 : 8**

**මතෙව් 7 : 21–23**

ස්වර්ගයේ සිටින මාගේ පියාණන්ගේ කැමැත්ත කරන්නා මිස, මට : ස්වාමිනි, ස්වාමිනි කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවෙති. එදින දී බොහෝ අය : ස්වාමිනි, ස්වාමිනි, ඔබගේ නාමයෙන් අපි අනාගතවාක්‍යය නොකියෙමුද ? ඔබගේ නාමයෙන් යක්ෂයන් දුරු නොකළෙමුද ? ඔබගේ නාමයෙන් නොයෙක් බලවත් ක්‍රියා නොකළෙමු දැයි මට කියති. එවිට මම: කිසිකලෙක මා ඔබලා නැඳින්නෙමි. අධර්මිෂ්ඨකම් කරන්නෙනි, මා කෙරෙන් අහක්ව යත්වා යයි ඔවුන්ට කියමි.

# යේසුගේ සැබෑ අනුගාමිකයන් එතුමට කීකරු වෙති 

### 1 යොහන් 2 : 3

අපි එතුමාගේ පනත් පවත්වමු නම්, අපි එතුමා අඳුනන බව එයින් දනිමුව.

### එසකියෙල් 36 : 27

මාගේ ආත්මය ඔබලා තුළ තබා, ඔබලා මාගේ පනත් ප්‍රකාර හැසිර මාගේ විනිශ්චයන් පවත්වමින් ඒවා කිරීමට ඔබලාව සලස්වමි.

### හෙබ්‍රෙව් 5 : 9

මෙසේ එතුමා පූර්ණකරනු ලැබ . . . තමාට කීකරු වන සියල්ලන්ටම සදාකාල ගැලවීමේ කර්තෘ වූසේක.

පාපයෙන් නිදහස්කරනු ලැබ, ඔබලා ධර්මිෂ්ඨකමේ දාසයන් වූ බැවින් . . . . . —රෝම 6 : 18

### එපීස 2 : 10

මක්නිසාද, අපි යහපත් ක්‍රියා කරන පිණිස, ක්‍රිස්තුස් යේසුස් තුළ මවනු ලැබ, දෙවියන්වහන්සේගේ නිර්මාණව සිටිමුව. ඒ යහපත් ක්‍රියාවල අප හැසිරෙන පිණිස, දෙවියන්වහන්සේ ඒවා කලින් සූදනම් කළසේක.

ක්‍රිස්තුස්වහන්සේ ඔබලා තුළ නම්, පාපය නිසා ශරීරය මැරී තිබෙන නුමුත්, ධර්මිෂ්ඨකම නිසා ආත්මය ජීවත් වෙයි. මක්නිසාද, ඔබලා මාංසික සේ ජීවත්වෙත් නම්, මැරෙන්ට ඕනෑය, නමුත් ආත්මයෙන් ශරීරයේ ක්‍රියා නසනවා නම්, ඔබලා ජීවත් වන්නාහ. —රෝම 8 : 10, 13

# 44 යේසු අනුගාමිකයන්ට ලෝකයා වෛර කරති

### යොහන් 15 : 18, 19

ලෝකයා ඔබලාට වෛර වේ නම්, ඔබලාට පලමුව මට වෛර වූ බව ඔබලා දනිති. ඔබලා ලෝකයාට අයිති නම්, ලෝකයා තම අයට ආදරේ වෙති. නුමුත් ඔබලා ලෝකයාගෙන් නොවන නිසාත්, මා විසින් ඔබලාව ලෝකයෙන් තෝරාගත් නිසාත්, ලෝකයා ඔබලාට වෛර වෙති.

### යොහන් 16 : 2ආ, 3

එසේය, ඔබලාව මරණ කවරෙකු නුමුත්, එය තමා දෙවියන්වහන්සේට කරන සේවයක් යයි සිතන කාලය පැමිණෙන්නේය. ඔවුහු, පියාණන්වද, මාවද, නාඳුනන නිසා ඒ දේවල් කරති.

### 1 යොහන් 3 : 1

අපි දෙවියන්වහන්සේගේ දරුවන් කියනු පිණිස, කෙබඳු ප්‍රේමයක්, දෙවියන්වහන්සේ අපට පිරිනමා අද්ද . . . . ලෝකයා එතුමව නැදින්න බැවින් අපවද නාඳුනති.

අප බොහෝ දුක්විඳිමින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුලුවීමට ඕනැය . . . . . —ක්‍රියා 14 : 22අ

### 2 තිමොති 3 : 12

එසේය, ක්‍රිස්තුස් යේසුස් තුල භක්තියෙන් ජීවත්වන සියල්ලෝම පීඩා විඳින්නෝය.

### යොහන් 16 : 33ආ

ලෝකයේ ඔබලාට පීඩා ඇත. නුමුත් ධෛර්‍යමත් වෙන්න, මම ලෝකයෙන් ජයගතිමි.

### 1 පේතෘස් 5 : 7

එතුමා ඔබලා ගැන සලකන බැවින්, ඔබලාගේ සියලුම කරදර එතුමා පිට තබන්න.

### යෙසායා 41 : 10

බය නොවන්න ඔබ, මක්නිසාද, මම ඔබ සමග සිටිමි. තැති නොගන්න, මක්නිසාද මම ඔබේ දෙවියන් වහන්සේය. මම ඔබව ශක්තිමත් කර, ඔබට උපකාර කරමි. එසේය, මාගේ ධර්මිෂ්ඨකම නමැති දකුණතින් ඔබව උසුලමි.

### හෙබ්‍රෙව් 13 : 6

ස්වාමින්වහන්සේ මාගේ උපකරුය; මිනිසා මට කුමක් කළත් මම බය නොවෙමි කියා මහත් ධෛර්යයෙන් කියමි.

### ගීතාවලිය 27 : 10

මාගේ මවද පියාද මාව අත්හැරි කළ, ස්වාමින්වහන්සේ මාව පිළිගන්නාහ.

### 1 පේතෘස් 4 : 14

ක්‍රිස්තුස්වහන්සේගේ නාමය නිසා ඔබලාට නින්දකරනු ලබයි නම්, ඔබලා ආශිර්වාද ලද්දහුය. මක්නිසාද, මහිමයේ ආත්මයාණන් වන දෙවියන්වහන්සේගේ ආත්මයාණන් ඔබලා කෙරෙහි රඳනසේක.

### පිලිප්පි 4 : 13 , 19

මා බලවත් කරන ක්‍රිස්තුස්වහන්සේ තුල මට සියල්ල කිරීමට පුළුවන. මාගේ දෙවියන්වහන්සේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුල සිය තේජස් සම්පතේ ප්‍රකාරයට ඔබලාගේ සියලු හිඟකම් පූර්ණ කරනසේක.

# පාපයෙන් හා සාතන්ගෙන් ජය

## 1 කොරින්ති 10 : 13

මිනිසා විසින් ඉසිලිය හැකි පරික්ෂාවක් මිස, අනිකක් ඔබලට පැමිණුනේ නැත. දෙවියන්වහන්සේ විශ්වාස කෙනෙකි. එතුමා, ඔබලගේ පුළුවන්කමට වඩා, ඔබලව පරික්ෂාකරනු ලැබීමට ඉඩ නොදී, ඔබලට පරික්ෂාව ඉවසිය හැකි වන පිණිස, ඒ සමගම ගැලවෙන මාර්ගයද සාදු දෙනසේක.

## යාකොබ් 4 : 7

එබැවින් දෙවියන්වහන්සේට යටත්ව සිටින්න, නුමුත් යක්ෂයාට විරුද්ධව සිටින්න. එවිට ඔහු ඔබ කෙරෙන් පලා යනවා ඇත.

ඔබට විරුද්ධව පව් නොකරන පිණිස, ඔබගේ වචනය මා සිතේ සඟවා ගතිමි. —**ගීතාවලිය 119 : 11**

## 1 යොහන් 1 : 7

නුමුත් එතුමා ආලෝකයේ සිටිනා සේ අපද ආලෝකයේ හැසිරෙමු නම්, අපට එකිනෙකා සමග පංගුකාරකම තිබේ. එතුමාගේ පුත්‍ර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයද සියලු පාපයෙන් අප පවිත්‍ර කරයි.

## 2 තිමොති 2 : 22

යෞවන තෘෂ්ණාවලින් දුරුව, පිරිසිදු සිතින් ස්වාමින්ට යාඥා කරන්නන් හා ධර්මිෂ්ඨකමත්, ඇදහිල්ලත්, ප්‍රේමයත් අනුව යන්න.

එලෙසම ඔබලා ස්ථිරවම පාපයට මැරී සිටින්නන් ලෙසද, අප ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් තුල දෙවියන් වහන්සේට ජීවත්ව සිටින්නන් ලෙසද සිතාගන්න. —**රෝම 6 : 11**

**ගීතාවලිය 62 : 8**

ජනතාවෙනි, සැමවිටම එතුමා කෙරෙහි විශ්වාස කරන්න; එතුමා ඉදිරියේ ඔබලගේ සිත් වගුරුවන්න. දෙවියන්වහන්සේ අපට රක්ෂාස්ථානයකි.

**යෙරෙමියා 17 : 14**

**ස්වාමීන්වහන්ස**, මා සුව කරන්න, එවිට මා සුවවේ; මා ගළවන්න, එවිට මා ගැලවේ. මක්නිසාද ඔබම මාගේ ප්‍රසංසාවය.

**1 තෙසලෝනික 5 : 17, 18**

නොකඩවා යාඥා කරන්න; සියල්ලේදී ස්තුති කරන්න. මක්නිසාද, ක්‍රිස්තුස් යේසුස් තුල දෙවියන්වහන්සේගේ කැමැත්ත මේය.

**යාකොබ් 1 : 5**

නුමුත් ඔබලා කිසිවෙකුට ප්‍රඥාව අඩු නම්, වරද නොතබන, බොහෝ සෙයින් සියල්ලන්ට දෙන දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. එවිට ඔබට එය දෙනු ලැබේ.

**ගීතාවලිය 27 : 8**

මාගේ මුහුණ සොයන්නැයි ඔබ කී විට, **ස්වාමිනි**, ඔබගේ මුහුණ සොයමියි මගේ සිත ඔබට කීය.

ඔබලා මා තුල පවතී නම්, මාගේ වචනය ඔබලා තුල පවතී නම්, ඔබලා කැමති දෙයක් ඉල්ලන්න. එය ඔබලට දෙනු ලැබේ.—**යොහන් 15 : 7**

**ගීතාවලිය 34 : 4**

මම ස්වාමීන් සෙව්මි. එතුමා මට පිළිතුරු දී, මාගේ සියලු බයින් මිදුහ.

# යේසුස් නැවත එනසේක–සූදනම්වෙන්න

## 1 තෙසලෝනික 4 : 16, 17

මක්නිසාද, ස්වාමීන්ම, මහත් ශබ්දයක් ද, උත්තම දේවදූතයාගේ හඬද, දෙවියන්වහන්සේගේ හොරණෑ නාදයද ඇතිව ස්වර්ගයෙන් බසිති. ක්‍රිස්තුස්වහන්සේ තුළ මළ අය පළමුව නැගිටිති. ඉන්පසු, ජීවත්ව ඉතිරිව සිටින අපි එක්විටම ඔවුන් සමග ස්වාමීන්ව මුණගැසීම පිණිස වලාකුල් වලින් අහසට ඇදගනු ලබති. මෙසේ අපි සදකල්ම ස්වාමීන්වහන්සේ සමග සිටිමු.

## 2 කොරින්ති 7 : 1

එබැවින් ප්‍රේමවන්තයෙනි, මේ පොරොන්දු අපට තිබෙන නිසා, මාංසයේද ආත්මයේද සියලු කිලුටුකම් වලින් අපම පවිත්‍ර කරගනිමින්, දෙවියන්වහන්සේ කෙරෙහි බියව ශුද්ධකම පූර්ණ කරගනිමු.

ඉතින් මාගේ ප්‍රිය දරුවෙනි, එතුමා තුල පවතින්න; එසේ කළ යුතු වන්නේ, එතුමා ප්‍රකාශ වූ පසු, එතුමගේ පැමිණීමේ දී, අප එතුමා ඉදිරියේ ලැජ්ජා නොවී, නිර්බීතකමින් සිටින පිණිසය. —1 යොහන් 2 : 28

## යාකොබ් 5 : 8, 9

ඔබලාත් ඉවසීමෙන් සිටින්න; ස්වාමීන්ගේ ඊම ළංව තිබෙන බැවින් ඔබලගේ සිත් ස්ථිර කරගන්න. සහෝදරයනි, ඔබලව විනිශ්වය කරනු නොලබනු පිණිස එකිනෙකාට විරුද්ධව නොකොඳුරන්න. බලව, විනිශ්වයකරු දෙරකඩ ඉදිරියෙහි සිටිති.

# දේව ආත්මයෙන් පූර්ණවෙන්න

## හිතෝපදේශ 1:23

මාගේ අවවාදයට හැරෙන්න. මෙන්න, මාගේ ආත්මය ඔබලා කෙරෙහි වගුරුවමි. මාගේ වචන ඔබලාට දන්වමි.

## ක්‍රියා 2:38

ඔබ සියල්ලන්ම පසුතැවිලිව, පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්ගේ නාමයෙන් බෞතීස්මය ලබන්න ; එවිට ශුද්ධාත්ම දීමනාව ඔබලා ලබන්නහුය.

## එපීස 5:18–21

මුද්‍රිකපානයෙන් මත් නොවෙන්න, එයින් අනාචාරකම් හටගනියි ; නමුත් ආත්මයාණන්ගෙන් පූර්ණ වී, ගීතිකාවෙන්ද, කවියෙන්ද, ආත්මික ගීයෙන්ද එකිනෙකාට කථාකර ඔබලාගේ සිතින් ස්වාමීන්ට ගායනාද, ගීතිකාද කරමින්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්ගේ නාමයෙන් සියලුදෙය ගැන පියවූ දෙවියන්වහන්සේට නිතරම ස්තුති කරන්න. ක්‍රිස්තුස්වහන්සේට බයව, එකිනෙකාට යටත්වෙන්න.

## පිලිප්පි 2:13

මක්නිසාද එතුමාගේ යහපත් කැමැත්ත නිසා කැමති වෙන්නටත්, වැඩ කරන්නටත් ඔබලා තුළ ක්‍රියා කරන්නේ දෙවියන්වහන්සේමයි.

## 1 කොරින්ති 3:16

ඔබලා දෙවියන්වහන්සේගේ මාලිගාව බවත්, දෙවියන්වහන්සේගේ ආත්මයාණන් ඔබලා තුළ වාසය කරන බවත් නොදනිත්ද?

Published in numerous languages by World Missionary Press, Inc. as God supplies funds in answer to prayer. If you would like more copies for prayerful distribution, specify which language(s) you need and how many booklets.

Distributed free of charge by:

**Every Home Crusade, 6 Park Place, Colombo**

නොමිලයේ - විකිණීමට නොවෙ

www.wmpress.org 6-17

Read booklets online or by App
www.wmp-readonline.org
1527 Sinhala HKG